සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

# කලාප අධ්‍යාපන කාර්යාලය - නිවිතිගල

## දෙවන වාර පරීක්ෂණය - 2024 11 ශ්‍රේණිය

ගණිතය I

32 S I

කාලය - පැය දෙකයි

විභාග අංකය: ...............................................

නිවැරදි බවට සහතික කරමි

...............................................

ශාලා නිරීක්ෂකගේ අත්සන

**වැදගත් :**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8 කින් සමන්විත ය.
- ✳ මෙම පිටුවේ හා ඇතුළත පිටුවල නියමිත ස්ථානයන්හි ඔබේ විභාග අංකය නිවැරදිව ලියන්න.
- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- ✳ පිළිතුර ලිවීමටත් එම පිළිතුර ලබා ගත් ආකාරය දැක්වීමටත් එක් එක් ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රයෝජනයට ගන්න.
- ✳ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී අදාළ පියවර හා නිවැරදි ඒකක දක්වන්න.
- ✳ පළමු කොටස සඳහා පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

**A කොටසේ**

එක් එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින්

**B කොටසේ**

එක් එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්

| පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංක | ලකුණු |
| I A | 1 - 25 | |
| I B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| II A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| II B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| එකතුව | | |

පරීක්ෂක : ...............................................


[ දෙවෙනි පිටුව බලන්න. ]

## A කොටස

- **ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**

1. මෝටර් රථයක් ආනයනයේ දී 23 % ක තීරු බද්දක් අයකරයි. බදු රහිතව එහි මිළ රු. 700 000 ක් නම්, බදු සහිතව එහි වටිනාකම සොයන්න.


2. රූපයේ ABC ත්‍රිකෝණයේ BC පාදය D තෙක් දික් කර ඇත. $A\hat{C}D$ කෝණයේ සමච්ඡේදකය CE නම්, දී ඇති තොරතුරු ඇසුරෙන් $E\hat{C}D$ කෝණයේ අගය සොයන්න.




3. මිනිසුන් 4 දෙනෙකුට දින 6 කදී නිම කළ හැකි කාර්යයක් දින 8 ක දී නිම කිරීමට මිනිසුන් කී දෙනෙකු අවශ්‍යවේද?


4. $lg\ x = 3$ නම්, $x$ හි අගය සොයන්න.

5. රූපයේ දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ පරිමිතිය සොයන්න.





6. $9xy^2$ , $12xy$ , $x^2y^2$ පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

7. රූපයේ දැක්වෙන තොරතුරු ඇසුරෙන් $S\hat{R}T$ කෝණයේ අගය සොයන්න.





8. $3x^2 + 7x + 4$ හි සාධක සොයන්න.

9. රූපයේ දී ඇති AB රේඛාවේ අනුක්‍රමණය සොයන්න.




10. $\frac{3}{xy^2} + \frac{4}{x^2y}$ සුළු කරන්න.


11. රූපයේ $a$ කෝණයේ අගය සොයන්න.





12. $\frac{3}{x} - \frac{1}{2x} = 1$ විසඳා $x$ හි අගය සොයන්න.

13. $n(P) = 8$ , $n(Q) = 15$ සහ $n(P \cup Q) = 19$ නම්, $n(P \cap Q)$ හි අගය සොයන්න.

14. පරිමාව 54 $cm^3$ වූ මෙම ප්‍රිස්මයේ දිග 6 $cm$ නම්, ත්‍රිකෝණාකාර පෘෂ්ඨයේ වර්ගඵලය සොයන්න.




15. ABCD සමාන්තරාස්‍රයකි. y කෝණයේ අගය සොයන්න.





16. $x^2 - 9 = 0$ විසඳා $x$ ට ගත හැකි අගයන් සොයන්න.

17. දී ඇති දත්ත ඇසුරින් මෙම සිලින්ඩරයේ පරිමාව සොයන්න.
(සිලින්ඩරයක පරිමාව $\pi r^2 h$ වේ.)





18. PQ විෂ්කම්භයක් වන මෙම වෘත්තයේ $P\hat{Q}R$ කෝණයේ අගය සොයන්න.





19. පරිමාව ලීටර් 960 ක් වූ ජල ටැංකියක් සම්පූර්ණයෙන් පිරීමට මිනිත්තු 8 ක් ගත වේ. එයට ජලය ගලා ඒමේ සීඝ්‍රතාවය තත්පරයට ලීටර්වලින් සොයන්න

20. කේන්ද්‍රය O වන මෙම වෘත්තයේ AB ජ්‍යායේ මධ්‍ය ලක්ෂ්‍යය C වේ.
AB = 12 cm ද, OC = 8 cm ද නම්, වෘත්තයේ අරය සොයන්න.





21. රූපයේ දී ඇති තොරතුරු ඇසුරෙන් XZ පාදයේ දිග සොයන්න.




22. 7 , 12 , 17 , ............. ශ්‍රේඪියේ 107 වන්නේ කී වන පදයද?


23. රූපයේ ABDE සහ BCDE සමාන්තරාස්‍ර දෙකකි.
පහත වගුවෙහි නිවැරදි පිළිතුරු සඳහා √ ලකුණ යොදන්න.




| | |
|---|---|
| AB = BC | |
| ABDE සමාන්තරාස්‍රයේ වර්ගඵලය = CDE Δ වර්ගඵලය | |
| $B\hat{A}E = C\hat{B}D$ | |

24. 5 , 16 , 5 , 18 , 12 , 20 සංඛ්‍යාවල මධ්‍යස්ථය සොයන්න.

25. ඉඩමක AB සෘජු මායිමට 8 m නියත දුරකින් CD ජල නළයක් එලා ඇත. AB හා AC මායිම් දෙකට සම දුරින් ජල නළය මත කරාමයක් සවි කළ යුතුව ඇත. පථ පිළිබඳ දැනුමෙන් කරාමය සවි කළ යුතු ස්ථානය E ලෙස ලකුණු කරන්න.




**B කොටස**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.**


(01) මිනිසෙක් තමා සතු මුදලකින් $\frac{2}{5}$ ක් ආහාරපාන සඳහා ද, $\frac{1}{4}$ ක් ජල සහ විදුලි බිල් ගෙවීමට ද, ඉතිරියෙන් $\frac{3}{7}$ ක් පොත්පත් මිල දී ගැනීමට ද වැය කරයි.

i. ආහාරපාන සහ ජල විදුලි බිල් ගෙවීමට මුළු මුදලින් කොපමණ භාගයක් වියදම් කරයිද?

ii. පොත්පත් මිල දී ගැනීමට රු. 12 000 ක් වියදම් කරයි නම් ඔහු ළඟ තිබූ මුළු මුදල කොපමණද?

iii. අවසානයේ ඉතිරි මුදල හා ආහාරපාන සඳහා වැය වූ මුදල අතර අනුපාතය සරළම ආකාරයෙන් දක්වන්න.

(02) මෙහි දැක්වෙන ලාංඡනය ABC ත්‍රිකෝණාකාර කොටසකින් සහ BC විෂ්කම්භය වූ අර්ධ වෘත්තාකාර කොටසකින් යුක්ත වේ.




i. BC දිග සොයන්න.

ii. අර්ධ වෘත්තයේ වක්‍ර කොටසේ දිග සොයන්න.

iii. ලාංඡනයේ පරිමිතිය කොපමණද?

iv. ලාංඡනයේ වර්ගඵලය සොයන්න.

v. ABC ත්‍රිකෝණයේ වර්ගඵලයට සමාන වන පරිදි BC එක් පාදයක් වන BCDE ඍජුකෝණාස්‍රයක දළ සටහනක් මිනුම් සහිතව මෙම රූපයේ ම ඇඳ දක්වන්න.

(03) සමන් රු. 100 000 යොදා, A නම් සමාගමක රු. 50 වූ කොටස් යම් ප්‍රමාණයක් මිලට ගනී. වසරක් අවසානයේ සමාගම විසින් කොටසකට රු. 5 ක ලාභාංශයක් ගෙවයි.

i. සමන් A සමාගමෙන් මිලට ගත් කොටස් ගණන සොයන්න.

ii. A සමාගමෙන් වසරක් අවසානයේ සමන්ට ලැබෙන ලාභය සොයන්න.

iii. වසරක් අවසානයේ සමන් එම කොටස් රු. 60 බැගින් විකුණයි නම්, සමන්ට ලැබෙන ප්‍රාග්ධන ලාභය සොයන්න.

iv. ඒ අනුව සමන්ට ලැබෙන මුළු ලාභයේ ප්‍රතිශතය සොයන්න.

(04) අවුරුදු සමයේ කැවිලි අනුභව කළ 100 දෙනෙකුගෙන් කළ විමසීමක දී පහත තොරතුරු දැනගන්නට ලැබුණි. එහිදී ලැබුණු තොරතුරු පහත දැක්වේ.

කැවුම් අනුභව කළ ගණන 25 කි.

කොකිස් අනුභව කළ ගණන 15 කි.

අතිරස අනුභව කළ ගණන 45 කි.


ඉතිරි පිරිස කෙසෙල් අනුභව කර ඇත.

මොවුන් අනුභව කළේ එක් වර්ගයක් නම්,

i. ඉහත තොරතුරු වට ප්‍රස්තාරයක දැක්වීම සඳහා කැවුම් අනුභව කළ අය දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය සොයන්න.

ii. කොකිස් අනුභව කළ අය දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය සොයන්න.


iii. ඉහත තොරතුරු වට ප්‍රස්තාරයේ දක්වන්න.



iv. කෙසෙල් අනුභව කළ අයගේ ගණන සොයන්න.

(05)(අ) 11 ශ්‍රේණියේ පංති නායකයෙකු සහ විෂය නායකයෙකු තෝරා ගැනීමේ පරීක්ෂණයක් සඳහා පිරිමි ළමුන් තිදෙනෙක් (3) සහ ගැහැණු ළමුන් දෙදෙනෙක් (2) ඉදිරිපත් විය.


i. මොවුන්ගෙන් දෙදෙනෙකු තේරී පත් විය හැකි ආකාර මෙම ලක්ෂ්‍ය ප්‍රස්තාරයේ “ × ”ලකුණින් දක්වන්න.



ii. පන්ති නායකයා පිරිමි ළමයෙකු ද, විෂය නායකයා ගැහැණු ළමයෙකු ද තේරී පත් වීමේ සම්භාවිතාව සොයන්න.

(ආ). පාඨමාලාවකට තෝරා ගැනීමේ තරඟ විභාගයකට පෙනී සිටි අපේක්ෂකයින් පිරිසක් ඉන් සමත්වීමේ සම්භාවිතාව $\frac{1}{8}$ ද, විභාගයෙන් සමත්ව සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීමේ සම්භාවිතාව $0.1$ ද වේ.

i. දී ඇති අසම්පූර්ණ රුක් සටහන ඉහත තොරතුරු ඇසුරෙන් සම්පූර්ණ කරන්න.




ii. මෙම විභාගයට පෙනී සිටි අයෙකු එම විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීමේ සම්භාවිතාව සොයන්න.

iii. මෙම විභාගයට පෙනී සිටි අයෙකු මෙම පාඨමාලාවට තේරී පත් නොවීමේ සම්භාවිතාව සොයන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි - All Rights Reserved

# කලාප අධ්‍යාපන කාර්යාලය - නිවිතිගල

## දෙවන වාර පරීක්ෂණය - 2024 11 ශ්‍රේණිය

ගණිතය II | 32 S II | කාලය - පැය තුනයි

**වැදගත් :**

- **A කොටසෙන්** ප්‍රශ්න **පහක්** හා **B කොටසෙන්** ප්‍රශ්න **පහක්** තෝරා ගෙන ප්‍රශ්න **දහයකට** පිළිතුරු සපයන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** ලියා දක්වන්න.
- සෑම ප්‍රශ්නයකට ම **ලකුණු** 10 බැගින් හිමි වේ.

**A කොටස**

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(01)

රුපියල් 45 000 ක් වූ රූපවාහිනියක් පළමුව රුපියල් 9 000 ක් ගෙවා ඉතිරිය සමාන මාසික වාරික 15 කින් ගෙවීමට රැගෙන යන්න.

වෙළඳ ආයතනයක පළකර තිබූ ඉහත දැන්වීමට අනුව රූපවාහිනිය 18 % ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ හීනවන ශේෂ ක්‍රමයට ලබාගන්නා අයෙකු ගෙවිය යුතු එක වාරිකයක වටිනාකම සොයන්න.

(02) $y = ax^2 + bx + c$ ආකාරයේ වර්ගජ ශ්‍රිතයක ප්‍රස්තාරය ඇඳීමට සුදුසු අගය වගුවක් පහත දැක්වේ.

| $x$ | -4 | -3 | -2 | -1 | 0 | 1 | 2 |
|---|---|---|---|---|---|---|---|
| $y$ | -7 | ........ | 1 | 2 | 1 | -2 | -7 |

(අ) (i). බණ්ඩාංකවල සමමිතිය ඇසුරෙන් $x = -3$ වන විට $y$ හි අගය සොයන්න.

(ii). $x$ හා $y$ අක්ෂ දිගේ කුඩා කොටු 10කින් ඒකකයක් වන පරිදි ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

(ආ) ඔබේ ප්‍රස්තාරය ඇසුරෙන්,

i. ශ්‍රිතයේ අගය 0.5 වන විට $x$ හි ධන අගය සොයන්න.

ii. ඉහත ශ්‍රිතය ධනව වැඩි වන $x$ හි අගය පරාසය සොයන්න.

iii. වර්තන ලක්ෂ්‍යයේ බණ්ඩාංක ලියා ඒ ඇසුරෙන් මෙම ශ්‍රිතය $y = -(x + p)^2 + q$ ආකාරයෙන් ලියා දක්වන්න.


(03)(අ) අධ්‍යාපන චාරිකාවකට සහභාගී වූ වයස අවුරුදු 12 ට අඩු අයගෙන් රුපියල් 700 බැගින් ද, වයස අවුරුදු 12 ට වැඩි අයගෙන් රුපියල් 900 බැගින් ද ගමන් වියදම් ලෙස අය කර ගන්නා ලදී. චාරිකාවට සහභාගී වූ මුළු පිරිස 40 දෙනෙකු වූ අතර ඔවුන් ගෙන් එකතු වූ මුළු මුදල රුපියල් 30 400 ක් විය.

i. චාරිකාවට සහභාගී වූ වයස අවුරුදු 12 ට අඩු අයගේ ගණන $x$ ද, අවුරුදු 12 ට වැඩි අයගේ ගණන $y$ ද, ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලක් ගොඩනගන්න.

ii. ඒවා විසඳීමෙන් වයස අවුරුදු 12 ට අඩු අයගේ ගණනත්, අවුරුදු 12 ට වැඩි අයගේ ගණනත් වෙන වෙනම සොයන්න.

(ආ) $v = \sqrt{2gh}$ සූත්‍රයේ $h$ උක්තය ලෙස ප්‍රකාශ කරන්න.

(04) සමතල බිමක පිහිටි AB අධිබලැති ඍජු විදුලි කනුවක පාමුල සිට මීටර් 65 ක් දුරින් P හි සිටින දේවින්දට කණුවේ මුදුන වූ B පෙනෙන්නේ $42°$ ක ආරෝහණ කෝණයකිනි. ඔහු AP ඔස්සේ තවත් මීටර් 30 ක් කණුවෙන් ඈතට ගොස් Q වෙත පැමිණේ. සෙන්ටි මීටර් 1 කින් මීටර් 10 ක් දැක්වෙන පරිමාණය ගෙන ඉහත තොරතුරු පරිමාණ රූපයක දක්වන්න. ඒ ඇසුරෙන් AB කණුවේ උසත් කණුව මුදුන වූ B සිට බලන විට පොළවේ පිහිටි Q ස්ථානය පෙනෙන අවරෝහණ කෝණයත් සොයන්න.




(05) ආරක්ෂක හමුදාවට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගත් අයදුම්කරුවන් පිරිසක ගේ බර පිළිබඳ තොරතුරු මෙසේය.


| බර (kg) | 54-56 | 57-59 | 60-62 | 63-65 | 66-68 | 69-71 | 72-74 |
|---|---|---|---|---|---|---|---|
| අයදුම්කරුවන් ගණන | 2 | 5 | 14 | 20 | 12 | 4 | 3 |

i. මධ්‍යස්ථය ඇතුළත් පන්ති ප්‍රාන්තරය ලියන්න.

ii. අයදුම්කරුවෙකු ගේ බරෙහි මධ්‍යනාය සොයන්න.

iii. කිලෝ ග්‍රෑම් 60 ට අඩු බරැති අය සඳහා එක් අයෙකුට රු.1400 ක විශේෂ කෑම වට්ටෝරුවක් සපයන ලද අතර ඉතිරි අයගේ ආහාර සඳහා එක් අයෙකුට රුපියල් 1100 බැගින් වැය කෙරේ. මසක පුහුණු කාලයක් සඳහා මෙම පිරිසට ආහාර සඳහා යන මුළු වියදම රුපියල් මිලියන 2ක් ඉක්මවන බව පෙන්වන්න.

(06). දිග $8cm$ වූ තුනී සෘජුකෝණාස්‍රාකාර තහඩුවක එක් මුල්ලකින්, පැත්තක දිග $x\ cm$ වූ සමචතුරස්‍රාකාර කොටසක් කපා ඉවත් කර ඇත. තහඩුවේ පළල සෙන්ටි මීටර් $x + 4$ වේ. එසේ කපා ඉවත් කළ පසු ඉතිරි වන කොටසේ



වර්ගඵලය 38 $cm^2$ නම්, $x$ මගින් $x^2 - 8x + 6 = 0$ සමීකරණය තෘප්ත වන බව පෙන්වන්න. එසේ කපා ඉවත් කළ සමචතුරස්‍රාකාර කොටසේ පැත්තක දිග දශමස්ථාන එකකට සොයන්න.


($x$ හි අගය 1 $cm$ ට වැඩි හා $\sqrt{10} = 3.16$ ලෙස ගන්න.)

**B කොටස**

ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(07). වෙසක් තොරණක මධ්‍යයේ සමචතුරස්‍රාකාරව සවිකර තිබූ කුඩා බල්බ රටාවක් රූපයේ දැක්වේ.

1 වන කුඩාම සමචතුරස්‍රයේ බල්බ 8 ක්ද,
2 වන සමචතුරස්‍රයේ බල්බ 12 ක් ද,
ආදී වශයෙන් පෙර සමචතුරස්‍රයට වඩා බල්බ 4ක් වැඩි වන පරිදි ඊළඟ සමචතුරස්‍රයේ බල්බ සවි කර ඇත.




i. මෙම බල්බ රටාවේ 1, 2, 3 වන සමචතුරස්‍ර තුනේ ඇති බල්බ සංඛ්‍යා පිළිවෙලින් ලියන්න.

ii. මේ ආකාරයට බල්බ සවි කර ඇති මුළු සමචතුරස්‍ර ගණන 15 ක් නම්, 15 වන සමචතුරස්‍රයේ ඇති බල්බ ගණන සොයන්න.

iii. මෙහි 1 වන සමචතුරස්‍රයේ රතු පාටින් ද, 2 වන සමචතුරස්‍රයේ නිල් පාටින් ද ආදී වශයෙන් එකක් හැර එකක් රතු හා නිල් පාට බල්බ සවි කර ඇත. ඒ අනුව සමචතුරස්‍ර සියල්ලෙහි සවි කර ඇති රතු බල්බ සහ නිල් බල්බ ගණන අතර වෙනස 36ක් බව පෙන්වන්න.

(08) පහත දැක්වෙන නිර්මාණ සඳහා $cm/mm$ පරිමාණයක් සහිත සරල දාරයක් හා කවකටුවක් පමණක් භාවිත කරන්න. ඔබේ නිර්මාණ රේඛා පැහැදිලිව දැක්විය යුතුය.

i. $PQ = 4.2\ cm$ , $PR = 6cm$ වන පරිදි $Q\hat{P}R = 60^\circ$ වන කෝණයක් නිර්මාණය කරන්න.

ii. Q හි දී PQ ට ලම්බකයක් නිර්මාණය කර එය දික් කළ PR හමුවන ලක්ෂ්‍යය S යැයි නම් කරන්න.


iii. QS පාදය ලම්බ සමච්ඡේදනය කර එහි මධ්‍ය ලක්ෂ්‍යය C ලෙස නම් කරන්න.

iv. QS විෂ්කම්භය වන වෘත්තය නිර්මාණය කර එහි අරය මැන ලියන්න.

v. PS පාදය වෘත්තයට හමුවන ලක්ෂ්‍යය D නම් $P\hat{D}Q$ කෝණය සෘජුකෝණයක් වන බවට හේතු දක්වන්න.

(09) පතුල සමචතුරස්‍රාකාර වූ ඝනකාභ හැඩැති ජල ටැංකියක පතුලේ දිග මීටර් $x$ ද, උස මීටර් $h$ ද වේ. අරය මීටර් $r$ හා උස මීටර් $h$ වූ සිලින්ඩරාකාර ටැංකියක පරිමාව, එම ජල ටැංකියේ පරිමාවට සමාන වේ. $r = \frac{x}{\sqrt{\pi}}$ බව පෙන්වා, $x = 10.25\ m$ ද, $\pi = 3.142$ ද ලෙස ගෙන ලඝු ගණක වගු භාවිතයෙන් $r$ හි අගය ආසන්න දෙවන දශමස්ථානයට සොයන්න.

(10) ABC ත්‍රිකෝණයේ BC පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය වන P පිහිටා ඇත්තේ AB = AP වන පරිදිය. AB = BQ වන ලෙස AB පාදය Q තෙක් දික් කර ඇත. රූපය පිටපත් කර ගෙන දී ඇති දත්ත එහි ඇතුළත් කරන්න. හේතු දක්වමින් පිළිතුරු සපයන්න.





i. APC Δ ≡ BPQ Δ බව පෙන්වන්න.

ii. $A\hat{C}P = B\hat{Q}P$ නම්, BPQ ත්‍රිකෝණය සමද්විපාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න.

iii. ඒ අනුව $BAP\Delta$ සමපාද ත්‍රිකෝණයක් බව පෙන්වන්න.

(11) උසස් පෙළ පන්තියක සිසුන් 45 දෙනෙකු ගෙන් විමසන ලදුව පහත තොරතුරු හෙළි විය. චිත්‍ර පමණක් හදාරණ ගණන 15 ක් වූ අතර ආර්ථික විද්‍යාව හදාරණ ගණන 18 ක් විය




මෙම වෙන් රූප සටහන පිටපත් කරගෙන, ඉහත දී ඇති තොරතුරු ඇසුරෙන්,

i. චිත්‍ර හා ආර්ථික විද්‍යාව හදාරන්නේ නැති ගණන සොයන්න.


ii. මේ විෂය දෙකෙන් එක් විෂයක් පමණක් හදාරණ ගණන 20 නම්, මෙම විෂයයන් දෙකම හදාරණ ගණන සොයන්න.

iii. A = { චිත්‍ර හදාරණ සිසුන්}
E = {ආර්ථික විද්‍යාව හදාරණ සිසුන්} ලෙස සැලකූ විට,

(අ). $n(A \cap E)^{/}$ අගය සොයන්න.

(ආ). $A^{/} \cap E^{/}$ ප්‍රදේශය අඳුරු කර දක්වන්න.

(12) රූපයේ AC යනු කේන්ද්‍රය O වූ වෘත්තයේ විෂ්කම්භයකි. BD යනු AC ට ලම්බ ජ්‍යායක් වේ.




(අ).
i. රූපය පිටපත් කර, OB සහ BC යා කරන්න.
ii. $A\hat{B}C$ කෝණයේ අගය සොයා, ඊට අදාල ප්‍රමේයය ලියන්න.

(ආ).
i. $A\hat{O}B = 180° - 2C\hat{B}D$ බවත්,
ii. AC මගින් $B\hat{A}D$ කෝණය සමච්ඡේදනය වන බවත් සාධනය කරන්න.

(ඉ).
i. වෘත්තයේ විෂ්කම්භය 34 cm ද, CE = 9 cm ද නම්, BD ජ්‍යායේ දිග ගණනය කරන්න.

--//--



PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න